පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 95
ආයතනයේ නම : පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
පාර්ලිමේන්තුවේ රජයේ ඇස්මුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் : 95
நிறுவனத்தின் பெயர் : நன்னடத்தை மற்றும் சிறுவர் பராமரிப்பு சேவைகள் திணைக்களம்
பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன்கீழ் நிறுவனங்களிற்குப் பொறுப்பான கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary Series No: 95
Name of the institution : Department of Probation and Child Care Services
Submission of observations of the Hon. Minister in charge of the institutions and steps taken with regard to the reports tabled by the committee on public Accounts in terms of Standing Order No. 119(4)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 95

ආයතනයේ නම - පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ආයතනය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග / වර්තමාන තත්ත්වය
01. <u>විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්</u> පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් නොමැති බව හා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නොපැවෙත්වෙන බව.	මු.රෙ 133 (ආ) ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ කාර්යයන් ආවරණය වන පරිදි අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මඟින් අභ්‍යන්තර විගණන කටයුතු සිදුකරනු ලබයි. ඊට අමතරව විගණන හා කළමනාරණ කමිටුවක් පත් කර ඇති අතර 2023 වසරේදී කමිටු රැස්වීම් 02ක් හා මෙම වසරේදී කමිටු රැස්වීම් 04 ක් පවත්වා ඇත.
02. <u>UNCRC දත්ත පද්ධතිය ප්‍රයෝජනයට නොගැනීම.</u> උපදේශන ගාස්තුද ඇතුළත්ව රු. 2,350,000 ක පිරිවැයක් දරා එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමට අදාළව එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් කමිටුව වෙත කාලීන හා නිවැරදි වාර්තා ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය සඳහා 2018 වර්ෂයේදී දෙපාර්තමේන්තුව වෙත පවරන ලද UNCRC දත්ත පද්ධතිය ප්‍රයෝජනයට ගෙන නොතිබීම.	2023.10.30 දින Open mind Solutions (Pvt) Ltd ආයතනය සමඟ දත්ත පද්ධතිය ස්ථාපනය (Host) කිරීම සඳහා ගිවිසුම්ගතව ඇත. ළමා අයිතිවාසිකම් සම්මුතිය අනුව ඉදිරිපත් කළ යුතු කාලාන්තර වාර්තාව සකස් කිරීමේදී තොරතුරු ඉදිරිපත් කළ යුතු සියලුම ආයතනවල අදාල නිලධාරීන් වෙත දත්ත ඇතුලත් කිරීම සම්බන්ධයෙන් පූහුණුවීම් ලබා දී ඇත. ඒ ඒ ආයතන විසින් දත්ත ඇතුලත් කිරීම මේ වන විට සිදු කරනු ලැබේ. UNCRC දත්ත පද්ධතිය සකස් කිරීමට සැකසූ පරිගණක යෙදුම මඟින් දත්ත ඇතුලත් කිරීමේදී ආයතන විසින් මුහුණ දුන් ප්‍රායෝගික හා තාක්ෂණික ගැටළු පිළිබඳ අධ්‍යයනය කර එම පරිගණක යෙදුම සම්බන්ධයෙන් නිර්දේශ හා විසඳුම් ලබා දීමට 2024.08.20 දින කමිටුවක් පත් කරන ලදී. අදාල කමිටුව 2024.10.23 දින රැස් වූ අතර එහිදී UNCRC දත්ත පද්ධතිය සකස් කිරීමට සකස් කර ඇති පරිගණක යෙදුමේ දෝෂ මහ හරවා ගෙන ඉදිරියට සුදුසු පරිදි එය නැවත සකස් කිරීමට කොපමණ මුදලක් වැයවේද? එය මූල්‍යමය වශයෙන් ලබාදිය යන්න විධිමත් අධ්‍යයනයක් ඔස්සේ සිදු කළ යුතු බව හා ඒ සඳහා විශ්ව විද්‍යාලයක පරිගණක ආයතනයක් මඟින් උපදේශන සේවාවක් ලබා ගත යුතු බව කමිටුවේදී තීරණය වී ඇත. ඉදිරියේදී ඒ සම්බන්ධ ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතය.
03. <u>රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2021 අගෝස්තු 04 වන දින පැවැත්වූ රැස්වීමේදී නිකුත් කළ නියෝග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය.</u> නියෝග අංක **06** - අනාරක්ෂිත/අවදානම් සහගත දරුවන් පිළිබඳ දත්ත ලබා ගැනීමේ ඇති දුර්වලතා හා ඒ සම්බන්ධව කටයුතු කිරීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සිටින නිලධාරීන් අතර පළාත් පරිවාස නිලධාරීන් නොසිටින බැවින් ළමුන්ගේ ගැටළු වාර්තාවීමේ හා නිසි සම්බන්ධීකරණයක් ඇති කිරීමේ ගැටළු පැවතීම.	• පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු යටතේ පරිවාස නිලධාරීන් සේවය කරන අතර ඔවුන්ගේ නිත්‍ය සේවා ස්ථානය පරිවාස කාර්යාල වේ. එහෙත් දරුවන් සම්බන්ධ ගැටළු සාකච්ඡා කෙරෙන කමිටු ව්‍යුහය ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා පළාත් කමිටු සඳහා මෙම නිලධාරීන්ගේ සහභාගීත්වය හා දායකත්වය සැපයීම සිදු වේ. • අනාරක්ෂිත හා අවදානම් සහගත දරුවන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් හඳුනා ගැනීමට ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්/ළමා හිමිකම් ප්‍රවර්ධන සහකාර විසින් විවිධ ක්‍රමවේද ඔස්සේ ප්‍රාදේශීය

<u>නිරීක්ෂණ/නිර්දේශ/නියෝග</u> (i)ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධනයට වැදගත්වන මෙම දත්ත පද්ධතීන් ඒකාබද්ධ කර ළමුන්ගේ ගැටළු වාර්තා වීමේ ජාතික දත්ත පද්ධතියක් පවත්වාගෙන යාමේ වැදගත්කම කාරක සභාව අවධාරණය කළේය. (ii) කාරක සභාවේදී අනාවරණය වූ තොරතුරු අනුව ප්‍රාදේශීය පරිචාස හා ළමාරක්ෂක සේවා නිලධාරීන්ට පාසැල් නොපැමිණෙන ළමුන් හා ළමා සාක්ෂරතාවය පිළිබඳ කඩිනමින් කටයුතු කිරීම සඳහා හා ඒ සම්බන්ධ තොරතුරු පාසැල් තුලින් ලබා ගැනීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව 2016 වර්ෂයේ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද ගැසට් නිවේදනය අනුව පළාත් මට්ටමින් හා ජාතික මට්ටමින් තොරතුරු ලබා ගැනීමේ වැඩපිළිවෙළක් සකස් කිරීම.	ලේකම් කාර්යාලයේ ළමා හා කාන්තා ඒකකයේ සියලු නිලධාරීන්ගේ ඒකාබද්ධ ප්‍රවේශ තුළින් කටයුතු කරනු ලබයි. I. ළමුන් සම්බන්ධ ගැටළු වාර්තාවීම් ජාතික පද්ධතියක් ලෙස පවත්වාගෙන යාම ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් සිදු කරයි. II. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති අංක 1963/30 අතිවිශේෂ ගැසට් නිවේදනය අනුව සෑම පාසලකම පාසල් අධීක්ෂණ කමිටු පිහිටුවීම සඳහා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් අතුරින් ප්‍රාදේශීය ලේකම්වරයා නියෝජනය කරනු ලබන ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු කමිටුවට ඇතුලත් කර ඇත. ප්‍රාදේශීය ලේකම් නම් කරනු ලබන නිලධාරියා ලෙස ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී/ළමා හිමිකම් ප්‍රවර්ධන සහකාර නම් කරන ලෙස දන්වා ලිපි ප්‍රාදේශීය ලේකම්වරුන්ට යොමු කර ඇත. එම ගැසට් නිවේදනය සඳහා මෙම නිලධාරීන්ගේ තනතුර ඇතුලත් කිරීමට සාකච්ඡා කළ නමුදු ඒ සඳහා දීර්ඝ ක්‍රියාවලියක් අනුගමනය කළ යුතු බව අධ්‍යාපන අමාත්‍යාංශය ප්‍රකාශ කරන ලදී. පාසල් නොයන ළමුන් පාසල්ගත කිරීම අධ්‍යාපන අමාත්‍යාංශයේ සෘජු වගකීමක් බව 2023.09.19 දින අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පැවති රැස්වීමේදී ප්‍රකාශ කරන ලදී. එම රැස්වීම පදනම් කරගනිමින් ලිපියක් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2023.10.02 දින නිකුත් කර ඇත. ඊට අනුව ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී/ළමා හිමිකම් ප්‍රවර්ධන සහකාර විසින් පාසල් නොයන බවට හඳුනාගත් දරුවන් නොවිධිමත් අධ්‍යාපන නිලධාරීන් වෙත යොමු කළ යුතු වේ. ඔවුන් විසින් එම දරුවන් පාසල්ගත කිරීමත්, අනතුරුව තොරතුරු ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී/සහකාර වෙත ලබා දීමත් සිදු කළ යුතු වේ. එලෙස දැනුම් දුන් දරුවන් සම්බන්ධයෙන් මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් පසු විපරම් කිරීම සිදු කරනු ලබයි.
04. <u>රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2021 අගෝස්තු 04 වැනි දින පැවැත් වූ රැස්වීමේ දී නිකුත් කළ නියෝග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය.</u> **නියෝග අංක 09** - නීති නිලධාරී තනතුර පූරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබීම.	නීති නිලධාරී තනතුරට බඳවා ගැනීමට අනුමැතිය ලබා ගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත 2024.07.03 දින යොමු කරන ලද කෙටුම්පත් ගැසට් නිවේදනය, ලකුණු පටිපාටිය හා අයදුම්පත සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී ඇති අතර ඒ අනුව ඉදිරි කටයුතු කිරීමට නියමිතය.
05. <u>රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2021 අගෝස්තු 04 වැනි දින පැවැත් වූ රැස්වීමේ දී නිකුත් කළ නියෝග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය.</u> **නියෝග අංක 10** - ළමුන් සම්බන්ධ කුලවද්දා ගැනීමේ ආඥා පනත ඇතුළු නීති සහ අණපනත් කාලීන අවශ්‍යතාවයට ගැලපෙන ලෙස සංශෝධනය නොවීම.	අධිකරණ අමාත්‍යාංශය මඟින් අංක MOJ/L4/563/2023 හා 2024.06.10 දිනැතිව ඉදිරිපත් කර ඇති සංශෝධිත පනත් කෙටුම්පත සඳහා පළාත් කොමසාරිස්වරුන්ගේ නිර්දේශ ලබා දෙන ලෙසට දන්වා ඇත. මෙයට අමතරව ළමා පනත සංශෝධනය සඳහාද කමිටුවක් අධිකරණ අමාත්‍යාංශය මඟින් පත්කර ඇත. කෙසේ වෙතත් මේ වන විට කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය යටතේ කුලවැද්දෑම් පනත හා ළමයින් හා යෞවනයන් පිළිබඳ ආඥා පනත ගැසට් කර ඇති බැවින් නව කමිටු නම් කිරීමේ අවශ්‍යතාව පිළිබඳව අධිකරණ අමාත්‍යාංශයෙන් විමසීමට කටයුතු කර ඇත.

06. <u>**රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2021 අගෝස්තු 04 වැනි දින පැවැත් වූ රැස්වීමේ දී නිකුත් කළ නියෝග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය.**</u> **නියෝග අංක 13** - අන්තර්ජාලය භාවිත කිරීමෙන් ළමුන් ගොදුරු වන අපචාර වලින් ඔවුන් මුදවාගත හැකි ක්‍රමවේදයක් සකස් කිරීමේ අවශ්‍යතාවය.	• පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් ළමා ආරක්ෂාව පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන අතර එම වැඩසටහන් තුළදී නූතන තාක්ෂණය සුරක්ෂිතව භාවිතා කිරීමට අදාලවද දැනුවත් කිරීම් සිදු කරනු ලැබේ. එමෙන්ම ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින්ද සයිබර් අවකාශය තුළ ළමුන් අපයෝජනයට ලක්වීම, අන්තර්ජාල භාවිතයට ඇබ්බැහිවීම වළක්වා ගැනීම හා නූතන තාක්ෂණය සුරක්ෂිතව භාවිතා කිරීම සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වනු ලැබේ. • සයිබර් අවකාශය තුළ දරුවන් සුරක්ෂා කිරීම සඳහා කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය මඟින් බහු ආයතනික මැදහත්වීම් තුළින් ක්‍රියාකාරකම් සඳහා දායකත්වය ලබා ගනිමින් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඇත.
07. <u>**රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2021 අගෝස්තු 04 වැනි දින පැවැත් වූ රැස්වීමේ දී නිකුත් කළ නියෝග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය.**</u> **නියෝග අංක 14** - ළමා අපරාධ සම්බන්ධයෙන් ජනමාධ්‍ය විසින් සිද්ධි වාර්තාකරණයේදී සිදු කරන අක්‍රමිකතා මඟහරවා සමාජ හිතකාමී මාධ්‍ය වාරණයක් ඇති කිරීමේ වැඩපිළිවෙලක් සකස් කිරීමේ අවශ්‍යතාවය.	• ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් කාන්තාවන් සහ ජනවාර්ගික - ආගමික සුළුතරයන්ගේ ගරුත්වය සුරැකීම කෙරෙහි අවධානය යොමු කරමින් මාධ්‍යවේදීන් සඳහා ආචාර ධර්ම සංග්‍රහයක් සකස් කිරීමේ කාර්යය වෙනුවෙන් ළමුන්ට බලපාන කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ මැදිහත්වීමෙන් ජාතික ළමා සභාවේ යෝජනා ලබා දී ඇත. පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව එම විද්වත් කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කරයි. • තවද මේ සම්බන්ධයෙන් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින්ද කටයුතු කරනු ලබයි. (ඇමුණුම 01)
08. ජාතික මට්ටමේදී කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය හා පළාත් පරිවාස හා ළමා කටයුතු දෙපාර්තමේන්තු අතර ඇති සංවිධාන ව්‍යුහය හා අන්‍යෝන්‍යව ක්‍රියාත්මක වීම. <u>නිරීක්ෂණ/නිර්දේශ/නියෝග</u> ඉහත නිලධාරීන් විසින් නිසි ලෙස ප්‍රාදේශීය මට්ටමේ, දිස්ත්‍රික් මට්ටමේ, පළාත් මට්ටමේදී ළමයින් සම්බන්ධ ගැටළුවලට/ පැමිණිලිවලට විසඳුම් ලබා දී අවසානයේදී ජාතික මට්ටමට පැමිණෙන විට සමස්ත ක්‍රියාවලිය නිවැරදිව සිදු වන ආකාරයේ වැඩපිළිවෙළක් සකස් කොට එය අධීක්ෂණය කිරීමේ ක්‍රමවේදයක් ඇති කළ යුතු බව.	පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව හා ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ළමා අයිතිවාසිකම් පිළිබඳ මෙහෙයුම් කමිටු සාමාජිකත්වය උසුලන බැවින් ආයතනික ඒකාබද්ධ වීමක් හා සම්බන්ධීකරණයක් ඒ තුළ සිදු වේ. 2023 ජූලි 04 පැවති රජයේ ගිණුම් කාරක සභා නියෝග පරිදි 2023 වර්ෂයේදී පළාත් හා දිස්ත්‍රික් මෙහෙයුම් කමිටු පැවැත්වීමට කටයුතු කර ඇති අතර 2024 වර්ෂයේදී විධිමත් පරිදි කමිටු පැවැත්වීම සඳහා උපදෙස් ලබා දී ඇත. මෙම කමිටු පැවැත්වීමට අදාල න්‍යාය පත්‍රයක් කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය විසින් 2018.01.10 දිනැතිව අංක 01/18 චක්‍රලේඛය මඟින් හඳුන්වාදී ඇති අතර ඒ පිළිබඳව පළාත් කමිටු දැනුවත්කර ඇති අතර ඒ අනුව කමිටු රැස්වීම් පැවැත්වේ. ළමා අයිතිවාසිකම් පිළිබඳ මෙහෙයුම් කමිටු ග්‍රාමීය, ප්‍රාදේශීය, දිස්ත්‍රික්, පළාත් හා ජාතික මට්ටමින් ක්‍රියාත්මක වේ. ග්‍රාමීය කමිටු මඟින් ළමුන් සම්බන්ධ ගැටළු හඳුනාගත්විට එම කමිටු මට්ටමින් මැදිහත්විය හැකි ගැටළු විසඳීමත් විසඳීමට අපහසු ගැටළු ප්‍රාදේශීය කමිටුවට යොමු

	කර විසඳුම් ලබා ගැනීමත් සිදු වේ. ප්‍රාදේශීය මට්ටමින් නොවිසඳුනු ගැටළු දිස්ත්‍රික්, පළාත් හා ජාතික මට්ටම දක්වා ඉදිරිපත් කිරීම සිදු වේ. ළමා අයිතිවාසිකම් පිළිබඳ ජාතික කමිටුවේදී අදාල සියළුම පාර්ශව සම්බන්ධ වී ජාතික මට්ටම දක්වා ඉදිරිපත් වූ ගැටළුවලට අදාලව නිවැරදි කිරීමේ වැඩපිළිවෙල හා ප්‍රතිපත්තිමය තීරණ ගනු ලබන අතර, ක්‍රියාත්මක තලයට ගෙන යාම සඳහා අදාල ආයතන හා පාර්ශව වෙත යොමු කරනු ලැබේ. ඒ සම්බන්ධව පසු විපරම් කිරීම පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව මගින් සිසු කරන අතර ජාතික කමිටු රැස්වීමේදී ද අදාල ප්‍රගතිය පිළිබඳ පසු විපරම් කරනු ලැබේ.
09. <u>ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ආයතනික දක්ත පද්ධතිය.</u>	අංක PCC/2/2/10 හා 2023.11.13 දිනැති ලිපිය මඟින් දත්ත පද්ධතිය සම්බන්ධ වාර්තාව රාජ්‍ය ගිණුම් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත. වර්තමාන ප්‍රගතිය සම්බන්ධයෙන් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් ලබා දෙන ලද වාර්තාව ඇමුණුම 2 මඟින් ඉදිරිපත් කර ඇත.

.....

සරෝජා සාවිත්‍රී පෝල්රාජ්

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
தேசிய சிறுவர் பாதுகாப்பு அதிகாரசபை
National Child Protection Authority

දුරකථන / தொ. பே. இல. / Telephone: 011-2778911, 011-2778912, 011-2778913, 011-2778914
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2778915
වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site: www.childprotection.go

නො. 330, තලවතුගොඩ පාර, මාදිවෙල, ශ්‍රී ජයවර්ධනපුර.
இல. 330, தலவத்துகொட வீதி, மாதிவெல, ஸ்ரீ ஜயவர்தனபுர.
No. 330, Thalawathugoda Rd., Madiwela, Sri Jayawardenepura.

ncpa@childprotection.gov.lk

මානව සම්පත් කළමනාකරණ අංශය
12 SEP 2024
අදාළ අංශය
12 SEP 2024

NCPA/IA/MWCA/2024/05/27

2024.09.12

ප්‍රධාන මූල්‍ය නිලධාරි,
කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම අමාත්‍යාංශය,
05 වන මහල,
සෙත්සිරිපාය II අදියර,
බත්තරමුල්ල.

රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තා පිළිබඳව ගන්නා ලද පියවර හා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම (පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 95)

ඔබ විසින් ඉහත උදෘතය යටතේ SMS/ACC/01/44 අංකයෙන් 2024.08.26 දිනැකිව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශය/නිරීක්ෂණය/නියෝග සම්බන්ධයෙන් ගන්නා ලද පියවර් කැඳවීමේ ලිපිය හා බැඳේ. එහි නියෝග අංක 14 යටතේ දක්වා ඇති කරුණු පරීදි ළමා අපරාධ සම්බන්ධයෙන් ජනමාධ්‍ය විසින් සිද්ධි වාර්තාකරණයේදී සිදු කරන අකුම්කකා මහහරවා සමාජශීලකාමී මාධ්‍ය වාරණයක් ඇති කිරීමේ වර්තමාන ප්‍රගතිය පහත පරිදි ඉදිරිපත් කරමි.

පිළිතුර

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් නෙවුම්පත් කොට තිබූ ළමා අපයෝජන / ළමා යැකිකරුවන් පිළිබඳ වාර්තාකරණයේ දී ළමා අයිතිවාසිකම් සුරැකීම සඳහා ජනමාධ්‍යවේදීන් විසින් සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳ ජාතික මාර්ගෝපදේශ සංගෘහය සමාලෝචනය කිරීමේ ප්‍රථම වැඩිවන් සාකච්ඡාව 2024.07.24 වන දින ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ දී පවත්වන ලදී. ඒ සඳහා විශ්ව විද්‍යාල මහාචාර්යවරුන් හා කථිකාචාර්යවරුන්, ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදීන්, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, සමාජ විද්‍යාඥයින්, ළමා මනෝ වෛද්‍යවරු, ළමා රෝග විශේෂඥවරු ආදී විවිධ අංශ නියෝජනය කරමින් විද්වතුන් සහභාගී වූහ. මෙහිදී ළමා අපයෝජන පිළිබඳ වාර්තාකරණයේ දී ගැඹුරින් සම්බන්ධ සාකච්ඡා හා මාධ්‍ය වැඩසටහන් සඳහා යොදාගැනීම, වෙළඳ ප්‍රචාරණ සඳහා යොදා ගැනීම ආදී සූක්ෂ්ම විෂයයන් යටතේ මෙම මාර්ගෝපදේශය සංවර්ධනය කිරීම පිළිබඳ අවධානය යොමු විය.

ඒ අනුව, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් සකසන ළමයා පිළිබඳ මාධ්‍ය භාවිතය සඳහා ජාතික මාර්ගෝපදේශය යැකයීමේ දෙවන විද්වත් කමිටු සාකච්ඡාව 2024.09.04 වන දින පවත්වන ලදී. එදින සාකච්ඡාවේදී විද්වත් කමිටු සාමාජිකයන් විසින් තම විෂය ක්ෂේත්‍ර යටතේ ජාතික මාර්ගෝපදේශය සූක්ෂ්ම කිරීමට යෝජනා ඉතාරෙන කරුණු අප වෙත ඉදිරිපත් කරන බවට සාකච්ඡා කරන ලදී. එසේම මෙම මාර්ගෝපදේශය ළමයින්ට ලිපියා ඉතාහෝ කරුණු පිළිබඳ අධ්‍යනය කරමින් සූක්ෂ්ම ලෙය සකස් කිරීමේ වගකීමක් ඇති කටයුත්තක් බව අවධාරණය කරන ලදී. ඊට අදාළ ඉදිරි කටයුතු සඳහා පියවර ගනිමින් පවතී.

අර්නෝල්ඩ් සිරිවර්ධන
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
தேசிய சிறுவர் பாதுகாப்பு அதிகாரசபை
National Child Protection Authority

இல. 330, தலவத்துகொட பாதை, மாதிவெல, ஸ்ரீ ஜயவர்தனபுர.
330, Thalawathugoda Rd., Madiwela, Sri Jayawardenepura.

தபால் தொலைபேசி Telephone: 011-2778911, 011-2778912, 011-2778913, 011-2778914
தொலைநகல் Fax: 011-2778915
மின்னஞ்சல் E-mail: ncpa@childprotection.gov.lk
இணையத்தளம் Web Site: www.childprotection.gov.lk

NCPA/IA/MWCA/2024/05/26

2024.09.02

ප්‍රධාන මූල්‍ය නිලධාරි,
කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය,
05 වන මහල,
සෙත්සිරිපාය II අදියර,
බත්තරමුල්ල.

රාජ්‍ය ණයකරු පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තා පිළිබඳව ගන්නා ලද පියවර හා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම (පාර්ලිමේන්තු මාලා අංක 95)

ඔබ විසින් ඉහත උපදෙස යටතේ SMS/ACC/01/44 අංකයෙන් 2024.08.26 දිනැතිව ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ආයතනික දත්ත පද්ධතිය සම්බන්ධයෙන් කාරක සභාවේ නිරීක්ෂණය/නිර්දේශ/නියෝග සම්බන්ධයෙන් ගන්නා ලද පියවර කෙදවීමේ ලිපිය හා බැඳේ. එමඟින් දක්වා ඇති කරුණු පරිදි ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ දත්ත පද්ධතිය සකස් කිරීමේ වර්තමාන ප්‍රගතිය පහත පරිදි ඉදිරිපත් කරමි;

පිළිතුර

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ දත්ත පද්ධතියෙහි ප්‍රථම අදියර ලෙස අභ්‍යන්තර දත්ත පද්ධතිය සකස් කර අවසන් කර ඇති අතර එම අදියරෙහි ගෙවීම් ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය වෙතු සාර්ක් සංවර්ධන අරමුදලේ ප්‍රතිපාදන මඟින් 2024.08.28 වන දින සිදු කර ඇත.

සාර්ක් සංවර්ධන අරමුදලෙහි ප්‍රතිපාදන අමාත්‍යාංශය වෙත ලැබීමේ ප්‍රමාදය හේතුවෙන් පළමු අදියරෙහි ගෙවීම් කාල රාමුව අනුව සිදු කිරීම ප්‍රමාද වීම මත දෙවන අදියරේ කටයුතු ආරම්භ කිරීම ප්‍රමාද තත්වයක පැවතිනි. ඒ අනුව, දෙවන අදියරේ ඉදිරි කටයුතු ආරම්භ කිරීම සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය සමඟ සාකච්ඡාවක් 2024.09.04 දින සිදු කිරීමට නියමිතය.

අභ්‍යන්තර දත්ත පද්ධතියෙහි අවදානම් තක්සේරුවක් ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (CERT) මඟින් සිදු කරන ලද අතර 2024.08.13 වන දින එම ආයතනය සමඟ පැවති සාකච්ඡාවෙන් පසුව එහි අවසන් වාර්තාව 2024 අගොස්තු මස අවසන් සතිය තුළ ලබා දීමට කටයුතු කරන බවට එනහ වන ලදී. ඒ අනුව අදාළ වාර්තාව 2024.08.30 දින ලබා දී ඇති අතර එම වාර්තාවේ දක්වා ඇති අධිකාරියේ වර්තමාන දත්ත පද්ධතියෙහි පවතින ආරක්ෂාව සම්බන්ධ අඩුපාඩු සකස් කිරීමේ ඉදිරි කටයුතු සිදු කරන ලෙස ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය වෙත දන්වා ඇත.

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ජාතික දත්ත පද්ධතිය සකස් කිරීම සම්බන්ධයෙන් සකස් කරන ලද සැලැස්ම පරිදි ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා පියවර ගනිමින් පවතී.

අනෝමා සිරිවර්ධන
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය